**පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 393**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
දසවැනි පාර්ලිමේන්තුව
(පළමුවැනි සභාවාරය)

# පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ හත්වැනි වාර්තාව

(2025.07.09 වැනි දින මහපොළ භාරකාර අරමුදල සම්බන්ධයෙන් සිදු කරන ලද විමර්ශනය)

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපති
පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර
මහතා විසින්
2025 දෙසැම්බර් මස 18 වැනි දින ඉදිරිපත් කරන ලදී

*2025 දෙසැම්බර් මස 18 වැනි දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් මුද්‍රණය කළ යුතු යැයි නියෝග කරන ලදී*

**<u>දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරය</u>**

**<u>පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සාමාජිකයන්</u>**

1. ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා, පා.ම., (සභාපති)
2. ගරු අර්කම් ඉල්යාස් මහතා,පා.ම., ( 2025.05.08 දින සිට)
3. ගරු මනෝ ගනේෂන් මහතා, පා.ම., *(2025.03.21 දින සිට.)*
4. ගරු (නීතිඥ) දයාසිරි ජයසේකර මහතා, පා.ම., *(2025.05.20 දින සිට)*
5. ගරු (නීතිඥ) අර්ජුන සුජීව සේනසිංහ මහතා, පා.ම., *(2025.03.21 දින සිට)*
6. ගරු ඩී.වී. චානක මහතා, පා.ම., *( 2025.03.21 දින සිට)*
7. ගරු (නීතිඥ) අනුරාධ ජයරත්න මහතා, පා.ම., *(2025.03.21 දින සිට)*
8. ගරු නලීන් බණ්ඩාර ජයමහ මහතා, පා.ම., *( 2025.03.21 දින සිට)*
9. ගරු. එස්.එම් මරික්කාර් මහතා, පා.ම., *(2025.03.21 දින සිට)*
10. ගරු මුජිබුර් රහුමාන් මහතා, පා.ම., *(2025.05.20 දින සිට)*
11. ගරු චමින්ද විජේසිරි මහතා, පා.ම., *(2025.03.21 දින සිට)*
12. ගරු අබූබකර් අතම්බාවා මහතා, පා.ම., *( 2025.05.08 දින සිට)*
13. ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා, පා.ම.,
14. ගරු (නීතිඥ) නිලන්ති කොට්ටහච්චි මහත්මිය, පා.ම., *(2025.03.21 දින සිට)*
15. ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය, පා.ම.,
16. ගරු දිලිත් ජයවීර මහතා, පා.ම., *(2025.03.21 දින සිට)*
17. ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා, පා.ම., *(2025.05.08 දින සිට)*
18. ගරු සුජීව දිසානායක මහතා, පා.ම.,
19. ගරු සුදත් බලගල්ල මහතා, පා.ම.,
20. ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මහතා, පා.ම.,
21. ගරු ලුතිනන් කමාන්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා, පා.ම., *(2025.03.21 දින සිට)*
22. ගරු ජගත් මනුවර්ණ මහතා, පා.ම.,
23. ගරු රුවන් මාපලගම මහතා, පා.ම.,
24. ගරු සුනිල් රාජපක්ෂ මහතා, පා.ම.,
25. ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා, පා.ම.,
26. ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා, පා.ම.,
27. ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා, පා.ම., *(2025.03.21 දින සිට)*
28. ගරු තිළිණ සමරකෝන් මහතා, පා.ම.,

29. ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා, පා.ම.,
30. ගරු (නීතිඥ) ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය, පා.ම.,
31. ගරු දිනේෂ් හේමන්ත මහතා, පා.ම., *( 2025.03.21 දින සිට)*

**<u>කාරක සභා ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලය</u>**

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ වත්මන් කාර්ය මණ්ඩලය පහත පරිදි වේ.

- සහකාර අධ්‍යක්ෂ (පරිපාලන) -හිමාලි සමරදිවාකර මෙය
- ප්‍රධාන නිලධාරි - එච්.රූපානි ද සොයිසා මිය
- නියෝජ්‍ය ප්‍රධාන නිලධාරී - එස්. එල්. වික්‍රම මයා
- පාර්ලිමේන්තු නිලධාරී - ජී. වී. එස්. කේ. කුමාරි මිය
- පාර්ලිමේන්තු නිලධාරී - අයි. එස්. ගෝමස් මිය
- පාර්ලිමේන්තු නිලධාරී - ජී. එල්. ඩී. ප්‍රනාන්දු මිය

**<u>කාරක සභා වාර්තා</u>**

www.parliament.lk යන වෙබ් අඩවියෙන් පහත සඳහන් ගමන් මාර්ගය ඔස්සේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ වාර්තා බාගත කළ හැක.

www.parliament.lk

↓

සිංහල

↓

පාර්ලිමේන්තුවේ කටයුතු

↓

කාරක සභා

↓

කාරක සභා වාර්තා

**පටුන**


| | | පිටු අංක |
|---|---|---|
| 1. | සභාපතිතුමාගේ සටහන | V |
| 2. | විධායක සාරාංශය | VI |
| 3 | දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරයේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ හත්වැනි වාර්තාව | VII |
| 4. | මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණන මතය | 1 |
| 5. | පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව මගින් විමර්ශනය කරන ලද ආයතනය- මහපොළ භාරකාර අරමුදල | 2-21 |

## <u>සභාපතිතුමාගේ සටහන</u>

පාර්ලිමේන්තුවේ විශේෂ කාර්යයන් සඳහා වන කාරක සභා යටතේ ස්ථාපිත, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව 2025.07.09 දින පරීක්ෂාවට ලක් කළ වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යාංශය යටතේ ඇති මහපොළ භාරකාර අරමුදලේ 2022 හා 2023 යන වර්ෂවල විගණකාධිපති වාර්තා සහ එහි වර්තමාන කාර්ය සාධනයට අදාළව සිදු කළ විමර්ශනයේ වාර්තාව මේ සමග ඉදිරිපත් කරමි.

1981 අංක 66 දරන මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල පනත යටතේ භාර අරමුදල ස්ථාපිත කර ඇති අතර, 2022 අංක 1 දරන මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල (සංශෝධන) පනත මගින්, ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල ලෙස එහි නාමය සංශෝධනය කර ඇත. මෙම අරමුදලේ දැක්ම, මෙහෙවර, අරමුණු හා පරමාර්ථ පිළිබඳව කාරක සභාවේ අවධානය යොමු විය.

ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනවල අධ්‍යාපනය හදාරන දරුවන් වෙනුවෙන් මූල්‍යාධාර සපයන ප්‍රමුඛතම රාජ්‍ය ආයතනයක් වන මහපොළ භාරකාර අරමුදල මගින් එහි අරමුණු හා පරමාර්ථ ළඟා කර ගැනීමේ දී එහි මුඛ්‍ය අරමුණ කොතරම් දුරට සාක්ෂාත් කරගෙන ඇත්ද යන්න පිළිබඳව මෙහිදී විමර්ශනය කරන ලදී.

මහපොළ භාරකාර අරමුදලේ විධායක තනතුරුවල පවතින පුරප්පාඩු කඩිනමින් සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතු බවට මෙන්ම භාරකාර මණ්ඩල රැස්වීම් නිසි පරිදි ක්‍රමානුකූලව පැවැත්වීම සම්බන්ධයෙන් ද කාරක සභාව විශේෂ අවධානය යොමු කළ අතර ඊට අදාළ නිර්දේශ ද නිකුත් කරන ලදී. භාර අරමුදලේ පරිපාලිත සමාගම් වන නැෂනල් වෙල්ත් කෝපරේෂන් සමාගම සහ එම සමාගමේ පරිපාලිත සමාගමක් වන නැට්වෙල්ත් සෙකියුරිටීස් සමාගම අලාභ ලැබීම පිළිබඳවත් මහපොළ භාරකාර අරමුදලේ මුදල් ආයෝජනය කරමින් ස්ථාපිත කරන ලද ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය (SLIIT) නැවත මහපොළ භාරකාර අරමුදල යටතට පවරා ගැනීම සම්බන්ධවත් නිර්දේශ මෙම වාර්තාවට අඩංගු කර ඇත.

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ විමර්ශනයන් මගින් ලැබිය යුතු උපරිම සේවය රටට ලැබෙන්නේ මෙම කමිටුවේ නිර්දේශ අඛණ්ඩව, පසු විපරම් කිරීම හා වගකිව යුතු සියළු පාර්ශවයන්ගේ අවධානය ඒ කෙරෙහි යොමු වීමත්, ඒවා ක්‍රියාත්මක වීම දක්වා ගෙන ඒමත් තුළින් වේ. මෙහිදී රටේ පරමාධිපත්‍යය හිමි මහජනතාවගේ සහ ඔවුන්ගේ නියෝජිතයන් ලෙසින් මේ ගරු සභාවේ කාර්යභාරය නිසි ලෙස අඛණ්ඩව පවත්වා ගනිමින් මෙහි ඉදිරිපත් වන නිර්දේශ ක්‍රියාත්මක කරවීම දක්වා අවශ්‍ය සියළුම පියවරයන් ගැනීමට උපරිම උත්සාහය ගැනීමටත්, වඩා ඵලදායී ලෙස මෙම නිර්දේශයන් ක්‍රියාත්මක කරවීමට උත්සාහ ගන්නා බව දන්වනු කැමැත්තෙමි.

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ කාර්යභාරය සාර්ථකව ඉටුකර ගැනීම සඳහා, කාරක සභාවේ සාමාජික ගරු මන්ත්‍රීවරුන්ගෙන් ලැබෙන සහායත්, කථානායකතුමා ප්‍රධාන පාර්ලිමේන්තුවේ කාර්ය මණ්ඩලයෙන් සහ කාරක සභාවේ උපදේශකවරු දෙදෙනාගෙන් ලැබෙන සහායත්, භාණ්ඩාගාර නිලධාරීන්ගෙන් සහ විශේෂයෙන්ම වැඩබලන විගණකාධිපතිතුමා ප්‍රධාන ජාතික විගණන කාර්යාලයෙන් ලැබෙන සහායත් අගය කොට සලකමි.

**වෛද්‍ය නිශාන්ත සමරවීර**
සභාපති
පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව

**විධායක සාරාංශය**

2025.07.09 දින පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් මහපොළ භාරකාරීත්ව අරමුදලේ 2022 හා 2023 වර්ෂයන්හි විගණකාධිපති වාර්තා හා එහි වත්මන් කාර්යසාධනය පිළිබඳව කරුණු පරීක්ෂා කරන ලදී.

මහපොළ භාරකාරීත්ව අරමුදල පිහිටුවීම, අරමුදලේ සංයුතිය, භාරකාර මණ්ඩල රැස්වීම් පැවැත්වීම, සංයුක්ත සැලැස්ම හා උපායමාර්ගික සැලැස්ම, ආයතනයේ කාර්ය මණ්ඩලය යනාදී ආයතනය සම්බන්ධ පොදු කරුණු මෙන්ම, භාර අරමුදලේ පරිපාලිත සමාගම් වන නැෂනල් වෙල්ත් කෝපරේෂන් සමාගම සහ එම සමාගමේ පරිපාලිත සමාගමක් වන නැට්වෙල්ත් සෙකියුරිටීස් සමාගම අලාභ ලැබීම පිළිබඳ වැදගත් කරුණු රාශියක් මෙහිදී සාකච්ඡා විය.

මහපොළ භාරකාරීත්ව අරමුදලේ විධායක මට්ටමේ තනතුරුවල පවතින පුරප්පාඩු කඩිනමින් පිරවීම සම්බන්ධයෙන් අවධානය යොමු කෙරුණු අතර භාරකාර මණ්ඩල රැස්වීම් නිසි පරිදි පවත්වා වැදගත් තීන්දු තීරණවලට එළඹිය යුතු බව මෙහිදී සාකච්ඡා විය.

මහපොළ අරමුදලේ මුදල් සහ භූමිය භාවිතා කර ආරම්භ කරන ලද ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය (SLITT), ක්‍රමයෙන් මහපොළ භාරකාර අරමුදලෙන් බැහැරව පෞද්ගලික ආයතනයක් ලෙස ක්‍රියාත්මක වන බවත්, 2015.05.12 වැනි දින ඇති කර ගත් ගිවිසුම අනුව මහපොළ භාරකාර අරමුදලට තිබූ අයිතිය හා ප්‍රතිලාභ සම්බන්ධ කරුණු ඉවත් කර ඇති බවත් ඒ අනුව මහපොළ භාරකාර අරමුදල සමග ඇති බැඳියාවන් ද ඉවත් කර ඇති බවත් කාරක සභාව පෙන්වා දුන්නාය.

ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයේ (SLITT) හිමිකාරීත්වය නැවත මහපොළ භාරකාරීත්ව අරමුදලට ගැනීමට අවශ්‍ය කටයුතු කිරීමේ වැදගත්කම මෙහිදී අවධාරණය කෙරිණි.

මහපොළ භාරකාරීත්ව අරමුදල මගින් උසස් අධ්‍යාපනය හදාරන ශිෂ්‍යත්වයක් ලැබීමට සුදුසුකම් සහිත සියලුම සිසුන් සඳහා මහපොළ ශිෂ්‍යත්වය ලබාදීමට අවශ්‍ය පියවර ගතයුතු බවත් විශ්වවිද්‍යාල සිසුන් සඳහා ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමේදී යාවත්කාලීන දත්ත පද්ධතියක් පැවතීමේ වැදගත්කම අවධාරණය කරමින් මෙම සාකච්ඡාවේ දී ලබාදුන් වැදගත් නිර්දේශ රැසක් මෙම වාර්තාව තුළ අඩංගුවී ඇත.

## දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරය
## පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ හත්වැනි වාර්තාව

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව, දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරයේ හත්වැනි වාර්තාව ඉදිරිපත් කරන්නේ සතුටිනි.

සියලු රාජ්‍ය සංස්ථා ද යම් ලිඛිත නීතියක් යටතේ රජය වෙත පවරනු ලැබ ඇති වෙළඳ ව්‍යාපාර සහ වෙනත් ව්‍යාපාර සහ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇති හෝ ලියාපදිංචි වී ඇති බවට සලකනු ලබන සහ ස්වකීය කොටස්වලින් සියයට පනහක් හෝ ඊට වැඩි ප්‍රතිශතයක් රජය හෝ රාජ්‍ය සංස්ථාවක් හෝ පළාත් පාලන ආයතනයක් හෝ විසින් දරනු ලබන සමාගම් සම්බන්ධව පාර්ලිමේන්තුව ඉදිරියේ තබනු ලබන ගිණුම් සහ වර්තමාන කාර්යසාධනය, විගණකාධිපතිවරයාගේ සහාය ඇතිව පරීක්ෂා කිරීම පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ කාර්යය වේ.

වර්තමානයේ දී, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ අධීක්ෂණය යටතට ගැනෙන, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව හා අය වැය දෙපාර්තමේන්තුව යටතේ නියාමනය වනු ලබන පොදු ව්‍යාපාර 462 ක් පවතී. (මූලාශ්‍රය: රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව- 2025.09.04 දිනට)

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරයේ (පළමු මාස 11 තුළදී) දී පහත සඳහන් පරිදි කාරක සභා රැස්වීම් පවත්වා ඇත.

| අනු අංකය | කැඳවූ ආයතනය | කාරක සභාව පැවැත් වූ දිනය |
|---|---|---|
| 1. | ජාතික තරුණ සේවා සභාව | 2025.02.18 |
| 2. | ජාතික තරුණ සේවා සභාව | 2025.02.20 |
| 3. | ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය | 2025.02.27 |
| 4. | ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය | 2025.03.05 |
| 5. | ජාතික ඖෂධ නියාමන අධිකාරිය | 2025.03.12 |

| | | |
|---|---|---|
| 6. | ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය | 2025.03.27 |
| 7. | ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (පුද්) සමාගම | 2025.04.02 |
| 8. | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව | 2025.05.08 |
| 9. | ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (පුද්) සමාගම | 2025.05.09 |
| 10. | ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල | 2025.05.15 |
| 11. | ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය | 2025.05.23 |
| 12. | ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය | 2025.06.04 |
| 13. | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 2025.06.20 |
| 14. | මහපොළ භාරකාර අරමුදල | 2025.07.09 |
| 15. | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව | 2025.07.17 |
| 16. | රාජ්‍ය දැව සංස්ථාව | 2025.07.23 |
| 17. | සිවිල් ගුවන් සේවා අධිකාරිය | 2025.08.20 |
| 18. | ශ්‍රී ලංකා වරාය අධිකාරිය | 2025.09.10 |
| 19. | භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය | 2025.09.12 |
| 20. | ලංකා විදුලිබල මණ්ඩලය | 2025.09.24 |
| 21. | ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය | 2025.10.08 |
| 22. | ලංකා සතොස ලිමිටඩ් | 2025.10.10 |
| 23. | ලංකා විදුලි බල මණ්ඩලයේ පරීක්ෂණයට අදාළව එල්.ටී.එල්. හෝල්ඩිංස් සමාගම හා එහි පරිපාලිත සමාගම් | 2025.10.24 |
| 24. | ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 2025.11.19 |
| 25. | ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 2025.11.26 |

ඒ අතරින්, 2025.07.09 වැනි දින පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා හා සමුපකාර සංවර්ධන අමාත්‍යාංශයේ විෂය පථයට අයත් මහපොළ භාරකාර අරමුදලේ 2022 හා 2023 යන වර්ෂවල විගණකාධිපති වාර්තා, විශේෂ විගණන වාර්තා සහ වර්තමාන කාර්යසාධනය පරීක්ෂාවට ලක් කොට කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ මෙම වාර්තාවට අන්තර්ගත කර ඇත.

## <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණන මතය</u>

මහපොළ භාරකාර අරමුදල විසින් 2022 හා 2023 වර්ෂයන්ට අදාළව ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගේ මතය පහතින් දක්වා ඇත.

| ආයතනය | වර්ෂය | |
|---|---|---|
| | **2022** | **2023** |
| **මහපොළ භාරකාර අරමුදල** | තත්ත්වාගණනය කළ මතය | ව්‍යාවනය කළ මතය |

<u>විගණන මත වර්ග</u>

**01. <u>තත්ත්වාගණනය නොකළ මතය</u> (Unqualified Opinion)**

මූල්‍ය ප්‍රකාශන ආයතනයේ මූල්‍ය තත්ත්වය සාධාරණව ඉදිරිපත් කර ඇති බව

**02. <u>තත්ත්වාගණනය කළ මතය</u> (Qualified Opinion)**

වාර්තාවේ සඳහන් කරුණුවලින් වන බලපෑම හැර ආයතනයේ මූල්‍ය තත්ත්වය, මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව.

**03. <u>මතය ව්‍යාවනය කිරීම</u> (Disclaimer of Opinion)**

ප්‍රමාණවත් හෝ උචිත විගණන සාක්ෂි හඳුනාගැනීමට නොහැකිවීම නිසා ගිණුම් සම්බන්ධව මතයක් ප්‍රකාශ කළ නොහැකි බව.

**04. <u>අහිතකර මතය (Adverse Opinion</u>)**

ආයතනයේ මූල්‍ය තත්ත්වය, මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව.

# මහපොළ භාරකාර අරමුදල

## *(වෙළඳ, වාණිජ ආහාර සුරක්ෂිතතා හා සමූපකාර සංවර්ධන අමාත්‍යාංශය)*

**විමර්ශනය කරන ලද දිනය- 2025.07.09**

## 01. ආයතනය සම්බන්ධ පොදු කරුණු

### 1.1 අරමුදල පිහිටුවීම

1981 අංක 66 දරන මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල පනත යටතේ ස්ථාපිත කර ඇති භාර අරමුදලේ නාමය, 2022 අංක 1 දරන මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල (සංශෝධන) පනත මගින්, ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල ලෙස සංශෝධනය කොට ඇත. එම අරමුදලේ දැක්ම, මෙහෙවර, අරමුණු හා පරමාර්ථ පිළිබඳව කාරක සභාවේ අවධානය යොමු විය.

### 1.2 අරමුදලේ සංයුතිය

අරමුදලෙහි භාරකාර මණ්ඩලය, ප්‍රාරම්භක හෝ ඔහුගේ නාමිකයකුගෙන්ද, ජනාධිපතිවරයා විසින් අවුරුදු තුනක කාලසීමාවක් සඳහා පත්කරනු ලබන ශ්‍රේෂ්ඨාධිකරණයේ විශ්‍රාමික විනිශ්චයකාරවරයකු හෝ විශ්‍රාමික විගණකාධිපතිවරයකු වන සභාපතිවරයෙකුගෙන් ද, උසස් අධ්‍යාපන විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා, අධ්‍යාපන විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා සහ වෙළෙඳ විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා ලෙස තත් කාලයෙහි ධූර දරන තැනැත්තන් සහ ප්‍රාරම්භක විසින් අවුරුදු පහක කාල සීමාවක් සඳහා පත් කරනු ලබන තැනැත්තන් දෙදෙනෙකුගෙන් සමන්විත වේ.

අධ්‍යාපන හා උසස් අධ්‍යාපන යන විෂයයන් දෙකෙහිම ලේකම් (ප්‍රධාන ගණන්දීමේ නිලධාරී) වශයෙන් එක් නිලධාරියෙක් කටයුතු කරන ඇතැම් අවස්ථාවන්හිදී භාරකාර මණ්ඩල රැස්වීම්වල ගණපූරණය (4) සම්පූර්ණ කර ගැනීමේ දී ප්‍රායෝගිකව ගැටලුකාරී වී තිබුණි.

**1.3** <u>භාරකාර මණ්ඩල රැස්වීම්</u>

2000 සිට 2025 වර්ෂයේ අප්‍රේල් දක්වා පවත්වා තිබූ භාරකාර මණ්ඩල රැස්වීම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| වර්ෂය | පැවැත්වූ රැස්වීම් ගණන | වර්ෂය | පැවැත්වූ රැස්වීම් ගණන |
|---|---|---|---|
| 2000 | 2 | 2013 | - |
| 2001 | 1 | 2014 | - |
| 2002 | 2 | 2015 | 5 |
| 2003 | 2 | 2016 | 4 |
| 2004 | 4 | 2017 | 3 |
| 2005 | 2 | 2018 | 5 |
| 2006 | - | 2019 | 5 |
| 2007 | 1 | 2020 | 6 |
| 2008 | 2 | 2021 | 8 |
| 2009 | 1 | 2022 | 4 |
| 2010 | 1 | 2023 | 4 |
| 2011 | 1 | 2024 | 6 |
| 2012 | 2 | 2025 අප්‍රේල් දක්වා 30 | 3 |

භාරකාර මණ්ඩල රැස්වීම් සංගතතාවයකින් පවත්වා නොතිබූ අතර එසේම ඇතැම් වර්ෂයන්හි භාරකාර මණ්ඩල රැස්වීම් පවත්වා නොතිබිණි.

වර්තමානයේදී මසකට එක් භාරකාර මණ්ඩල රැස්වීමක් බැගින් පැවැත්වීමට කටයුතු කර තිබුණි. මහා භාණ්ඩාගාරයෙන් ලැබෙන මුදල් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හරහා අරමුදලට ලැබෙන බැවින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිවරයා අරමුදලෙහි භාරකාර මණ්ඩල සමාජිකයෙක් වශයෙන් (පත්කළ භාරකරුවෙක්) කටයුතු කරනු ලැබේ.

භාරකාර අරමුදල විශාල අරමුදල් ප්‍රමාණයක් සංසරණය වන අරමුදලක් වන බැවින් හා විශ්වවිද්‍යාල සිසුන් සඳහා විශාල සේවයක් සපයන බැවින් මෙන්ම ඉතිහාසයේ සිදුවී ඇති යම් යම් බරපතල සිද්ධි සම්බන්ධයෙන් නිරන්තර සාකච්ඡාවන් අවැසි බැවින් භාරකාර මණ්ඩල රැස්වීම්, මාසිකව පැවැත්වීම ඉතා වැදගත්බව ප්‍රාරම්භක භාරකරු වන වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා හා සමූපකාර සංවර්ධන අමාත්‍යාංශය භාර අමාත්‍යතුමා කාරක සභාව හමුවේ අවධාරණය කළේය.

<u>නිර්දේශය</u>

i. භාරකාර මණ්ඩල රැස්වීම් පැවැත්වීම සම්බන්ධයෙන් සුදුසු පරිදි මාර්ගෝපදේශ සකස් කිරීම.

**1.3.1 - <u>සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලයට භාරකාර අරමුදලෙහි නියෝජනය</u>**

සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙන් ලැබෙන ලාභය ජනාධිපති අරමුදල හරහා මහපොළ භාරකාර අරමුදලට බැර වන බැවින් සහ එහි කොටස්වලින් 50% ක අයිතියක් මහපොළ භාරකාර අරමුදල සතුව පවතින බැවින් අරමුදලෙහි සාමාජිකයෙක්, සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය තුළ සිටින බව කාරක සභාවට අනාවරණය විය.

එමෙන්ම සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ලාභය ජනාධිපති අරමුදලට බැරවන බවත් ඉන් 50% ක් භාරකාර අරමුදලට ලබා දෙන බවත් තවදුරටත් අනාවරණය විය.

## 1.4 විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම

විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් කාර්තුවකට එකක්වත් පැවැත්විය යුතු වුවත් මහපොළ භාරකාර අරමුදල විසින් 2022 සහ 2023 වර්ෂයන් සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් එක බැගින් පවත්වා තිබුණු අතර, 2024 වර්ෂයේ සිට විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබිණි.

එසේම නව භාරකාර මණ්ඩලය ජනවාරි මාසයේ දී පත්වී තිබුණි. 2025 වර්ෂය සඳහා මේ දක්වා එකදු විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමක් හෝ පවත්වා නොතිබිණි. එසේම විගණන හා කළමනාකරණ කමිටුවේ සභාපතීත්වය දරනු ලබන්නේ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසිනි.

**නිර්දේශ**

i. විගණන හා කළමනාකරණ කමිටු සක්‍රීය කිරීමට කටයුතු කිරීම.
ii. විගණන හා කළමනාකරණ කමිටුවේ සභාපතීත්වය අත්‍යවශ්‍යම හා සුදුසුම පුද්ගලයා විසින් දරන බවට වගබලා ගැනීම. (උදා:-අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා)

## 1.5 සංයුක්ත සැලැස්ම හා උපායමාර්ගික සැලැස්ම

මහපොළ භාරකාර අරමුදල විසින් 2024 - 2026 වර්ෂ සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබූ නමුත් එය 2025 වර්ෂය සඳහා යාවත්කාලීන කර නොතිබුණි.

මෙහිදී උපායමාර්ගික සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම ආයතනයේ අරමුණු, පරමාර්ථ හා ආයතනයේ වර්තමාන තත්ත්වය සමග අනුගත වීමේ අවශ්‍යතාවයත්, උපායමාර්ගික සැලැස්ම වාර්ෂිකව යාවත්කාලීන විය යුතු බවත් එහි කොටසක් ලෙස වාර්ෂික සැලැසුම් හා ක්‍රියාකාරී සැලැස්ම සකස් විය යුතු බවත් කාරක සභාව අවධාරණය කළ අතර යාවත්කාලීන උපායමාර්ගික සැලසුම සකස් කිරීමට ගතවන කාලය සම්බන්ධයෙන් කාරක සභාව විමසීය.

කාර්ය මණ්ඩලයේ අත්‍යාවශ්‍ය තනතුරු සඳහා පුරප්පාඩු පවතින බවත් ආයතනයේ සිටින එකම විධායක නිලධාරියා වනුයේ අරමුදලේ සභාපතිවරයා වන බවත් ආයතනයේ අධ්‍යක්ෂ, ගණකාධිකාරී හා අභ්‍යන්තර විගණක යන තනතුරු දීර්ඝ කාලයක් තිස්සේ පුරප්පාඩුව පවතින බවත් කාරක සභාව හමුවේ අනාවරණය විය.

<u>නිර්දේශය</u>

i. වර්තමාන රජයේ ප්‍රතිපත්ති සමග අනුගතවන පරිදි උපායමාර්ගික සැලැස්ම යාවත්කාලීන කිරීම.

### 1.6 කාර්ය මණ්ඩල සංයුතිය

2024 දෙසැම්බර් 20 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අනුමැතිය ප්‍රකාර 2025 අප්‍රේල් 30 දිනට භාර අරමුදලේ සංයුතිය පහත දැක්වේ.

| **සේවක කාණ්ඩය** | **අනුමත සංඛ්‍යාව** | **දිනට 30 අප්‍රේල් 2025 තථ්‍ය සංඛ්‍යාව** | | **පුරප්පාඩු සංඛ්‍යාව** |
|---|---|---|---|---|
| | | **ස්ථිර** | **වැඩබලන** | |
| ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටම | 01 | - | - | 01 |
| මධ්‍යම කළමනාකරණ මට්ටම | 03 | - | 01 | 03 |
| කණිෂ්ඨ කළමනාකරණ මට්ටම | 02* | 02 | - | - |

| | | | | |
|---|---|---|---|---|
| කළමනාකරණ සහකාර | 12 | 09 | - | 03 |
| ප්‍රාථමික මට්ටම | 04 | 02 | - | 02 |
| මුළු සේවක සංඛ්‍යාව | 22 | 13 | 01 | 09 |

*එක් තනතුරක් දරන්නාට පෞද්ගලික වන සේ අනුමත කර ඇත.

ඒ අනුව, ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ පුරප්පාඩු 1ක්, මධ්‍යම කළමනාකරණ මට්ටමේ තනතුරු 03ක්, කළමනාකරණ සහකාර තනතුරු 03 ක් හා ප්‍රාථමික සේවක මට්ටමේ තනතුරු 02 ක් ඇතුළත්ව මුළු සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු 09 ක් පැවතුනි.

**<u>නිර්දේශය</u>**

i. මහපොළ භාරකාර අරමුදලේ කටයුතු නිසි ලෙස පවත්වා ගැනීම සඳහා අවශ්‍ය නිලධාරීන් බඳවා ගැනීම  මූලික ප්‍රමුඛතාවයක් ලෙස සලකා එම කටයුතු කඩිනමින් අවසන් කිරීම.

## 1.7 <u>අභ්‍යන්තර විගණක තනතුර පුරප්පාඩුව පැවතීම</u>

2022 අප්‍රේල් 04 වැනි දින පත්කර තිබූ  අභ්‍යන්තර විගණක, 2023 ජූලි 30 දින සේවයෙන් ඉවත් වීමෙන් අනතුරුව, 2023 ඔක්තෝබර් 10 දින සිට වාණිජ දෙපාර්තමේන්තුවේ ගණකාධිකාරී, වැඩබැලීමේ පදනම මත එම තනතුරට පත්කර තිබූ නමුත් එම නිලධාරියා ද 2024 අප්‍රේල් 30 දින ඉල්ලා අස්වීම හේතුවෙන්, එදින සිට අරමුදලේ අභ්‍යන්තර  විගණක තනතුර පුරප්පාඩුවී පැවතුනි.

සහකාර අධ්‍යක්ෂ (මුදල්) හා අභ්‍යන්තර විගණක යන තනතුරු සඳහා බඳවා ගැනීමට අදාළව ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අනුමැතියකින් තොරව පුවත්පත් දැන්වීම් පළ

කිරීම සම්බන්ධයෙන් හා ඒ සඳහා වියදම් දැරීමට ඇති හැකියාව සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ හිටපු ලේකම්වරයා විසින් විවිධ කරුණු විමසීම් කර තිබුණි.

ආයතනයේ අත්‍යවශ්‍ය තනතුරු 2ක පුරප්පාඩු පිරවීම සඳහා කටයුතු කිරීමේදී, අමාත්‍යාංශයේ හිටපු ලේකම් විසින් එම ක්‍රියාවලිය අඩපණ කිරීමට උත්සාහ දැරීම සම්බන්ධයෙන් කාරක සභාව කරුණු විමසීය.

අග්‍රාමාත්‍ය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් ස්ථාපිත කමිටුවේ නිර්දේශ මත පදනම්ව සියලු බඳවා ගැනීම් සිදු කළ යුතු බවට චක්‍රලේඛයක් නිකුත් කර තිබූ නමුත්, මෙම පුරප්පාඩු පිරවීම සඳහා අයදුම්පත් කැඳවීමේ ක්‍රියාවලියේ දී උක්ත සඳහන් කමිටුවේ අනුමැතිය  ලබාගෙන නොමැති වීම පිළිබඳව, ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වශයෙන් රජය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛයකට පටහැනිව ක්‍රියා කිරීම සම්බන්ධව පිළිතුරු සැපයීමට වගකීමට බැඳී ඇති බැවින් ඒ පිළිබඳව විමසූ බව  අමාත්‍යාංශයේ හිටපු ලේකම්වරයා කාරක සභාව හමුවේ කරුණු දැක්වීය.

අමාත්‍යාංශ ලේකම්වරයා නිල බලයෙන්ම භාරකාර මණ්ඩලයේ සාමාජිකයෙක් වන බැවින් යම් අඩුපාඩුවක් පවතීනම් භාරකාර මණ්ඩල රැස්වීමේදී එය පෙන්වා දීමට හැකියාව තිබූ බව පෙන්වා දුන් කාරක සභාව, එහි ඇති පරස්පරතාව පිළිබඳව ප්‍රශ්න කළාය.

අරමුදලේ හිටපු අධ්‍යක්ෂවරයා එම ධූරයට පත්වීමේදී, එවකට වෙළඳ අමාත්‍යවරයා එම නිලධාරියාව තනතුරෙන් ඉවත් කිරීමට උත්සාහ දරා ඇති බවත්, අමාත්‍යාංශයේ හිටපු ලේකම්වරයා එම නිලධාරියාගේ රාජකාරි කටයුතුවලදී බාධා කොට ඇති බවත් කාරක සභාවේදී අනාවරණය විය.

2022 වර්ෂයේදී සංශෝධිත 1981 අංක 66 දරන මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල පනත යටතේ ස්ථාපිත භාර අරමුදලට නිලධාරීන් බඳවා ගැනීම සඳහා ස්වාධීන අධිකාරී බලයක් තිබේ. එසේ තිබියදීත් අභ්‍යන්තර විගණක තනතුර පුරප්පාඩුව පැවතීම හිතාමතාම සිදු කර ඇති බව කාරක සභාවට අනාවරණය විය.

කාර්ය මණ්ඩලය තීරණය කිරීමට භාරකාර මණ්ඩලයට බලය තිබුණ ද බඳවා ගැනීම් සිදු කිරීම සඳහා අග්‍රාමාත්‍ය ලේකම්වරයා ප්‍රමුඛ කමිටුවේ අනුමැතිය අවශ්‍ය බව හා භාරකාර මණ්ඩලයේ තීරණය, අමාත්‍යාංශ ලේකම් හරහා අග්‍රාමාත්‍ය ලේකම් ප්‍රමුඛ කමිටුව සඳහා ඉදිරිපත් කළ යුතු බවත් අදාළ අනුමැතිය ලද පසු එම බඳවා ගැනීම් ක්‍රියාවලිය ආරම්භ කළ යුතු බවටත් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරිය කරුණු පැහැදිලි කළාය.

රාජ්‍ය ආයතනවල අකාර්යක්ෂමතාවයට මූලික හේතුවක් වී ඇත්තේ ආයතනවල අත්‍යවශ්‍ය කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පැවතීම හා එම බඳවා ගැනීම් කඩිනම් කිරීමට අවශ්‍ය පියවර නොගැනීම බව කාරක සභාව පෙන්වා දුන්නාය.

බඳවා ගැනීම් ප්‍රමාද කිරීම හේතුවෙන් හිටපු අධ්‍යක්ෂවරයා විශ්‍රාම යාමේදී ඔහුගේ වගකීම භාරදීමට නිසි නිලධාරියෙක් නොසිටි හෙයින් අරමුදලේ මුදල් ආයෝජනය කළ නොහැකි වී තිබුණ අතර එමගින් අරමුදලට රුපියල් මිලියන 500 ක අලාභයක් සිදුවී තිබුණි.

ආයෝජන සම්බන්ධයෙන් ලේකම්වරයාට තනි තීරණයක් ගත නොහැකි බවත් එය ආයෝජන කමිටුව හරහා සිදු කළ යුතු බවත් අරමුදලේ උපපාලිත සමාගම් සම්බන්ධයෙන් වෝහාරික විගණනයක් සිදු කරන ලෙස අමාත්‍යාංශයේ හිටපු ලේකම්වරයා විසින් අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් යොමු කරමින් ඉල්ලීමක් කර තිබූ බවත් අනාවරණය විය.

**<u>නිර්දේශය</u>**

i. මහපොළ භාරකාර අරමුදලේ කටයුතු නිසි ලෙස පවත්වාගෙනයාම සඳහා අවශ්‍ය නිලධාරීන් බඳවා ගැනීම මූලික ප්‍රමුඛතාවයක් ලෙස සලකා බඳවා ගැනීම් කටයුතු කඩිනමින් අවසන් කිරීම.

## 03. 2021 ජනවාරි 08 වැනි දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය

### 3.1 නිර්දේශ අංක 10 - මහපොළ භාරකාර අරමුදලේ පරිපාලිත සමාගම් අලාභ ලැබීම

භාර අරමුදලේ පරිපාලිත සමාගම් වන නැෂනල් වෙල්ත් කෝපරේෂන් සමාගම සහ එම සමාගමේ පරිපාලිත සමාගමක් වන නැට්වෙල්ත් සෙකියුරිටීස් සමාගම අලාභ ලැබීම පිළිබඳ වගකිව යුතු පාර්ශවයන් හඳුනා ගන්නා තෙක් මෙම සමාගම් ඇවර නොකිරීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරීට නිර්දේශ කර තිබුණි. එසේම ඒ සම්බන්ධව KPMG සමාගම සකස් කරන ලද සම්පූර්ණ වාර්තාව පරීක්ෂා කිරීමට හා අධිකරණ නියෝග ලබා ගැනීමට ද උපදෙස් ලබා දී තිබුණි.

**සී/ස නැට් වෙල්ත් කෝපරේෂන් සමාගම**

අරමුදලේ ආයෝජන කළමනාකරණය කිරීමේ අරමුණින් රු. මිලියන 200 ක (සාමාන්‍ය කොටස් 20, 000,007 ක) මූලික ආයෝජනයකින් මෙම සමාගම 2003 මාර්තු මස 23 වන දින සීමාසහිත පොදු සමාගමක් ලෙස ලියාපදිංචි කර තිබුණි. අරමුදල විසින් මෙම සමාගම සමග 2003 නොවැම්බර් 18 දින එළඹි ගිවිසුමට අනුව අරමුදල සතු රු. මිලියන 3,160.7 ක් වූ අරමුදල් කළඹ කළමනාකරණය කිරීම මෙම සමාගමට පවරා තිබුණි.

එමෙන්ම ශ්‍රී ලංකා මහ බැංකුවේ බැඳුම්කර ගනුදෙනුව සිදු වූ අවස්ථාවේදී මෙම සමාගම 8 වරක් leverage කර රුපියල් මිලියන 800-1000 ක පමණ අලාභයක් සිදු වී ඇත. ඒ සම්බන්ධයෙන් වෝහාරික පරීක්ෂණයක් ද සිදු කර තිබුණි. නමුත් මේ සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිදු කරමින් තිබූ පරීක්ෂණය අතරමග නවත්වා තිබුණි. 2025.01.25 දිනැති විශේෂ විගණන වාර්තාව අනුව 2017.12.31 දින වන විට නැට් වෙල්ත් කෝපරේෂන් සමාගමේ ආයෝජනය රුපියල් මිලියන 985 කි.

**<u>නැට් වෙල්ත් සෙකියුරිටීස් සමාගම</u>**

සී/ස නැට් වෙල්ත් කෝපරේෂන් සමාගම විසින් රු. 200, 000, 070 ක (කොටස් 20, 000,007 ක) මූලික ආයෝජනයක් සිදු කරමින් එම සමාගමෙහි පරිපාලිත සමාගමක් වශයෙන් සී/ස නැට්වෙල්ත් සෙකියුරිටීස් සමාගම 2003 ජුනි මස 23 දින ස්ථාපිත කර තිබුණි. 2021 දෙසැම්බර් 31 දින වන විට සී/ස නැෂනල් වෙල්ත් කෝපරේෂන් සමාගම විසින් මෙකී සමාගමෙහි කොටස් 117, 500,007 ක රු. 1,175,000,070 ක් ආයෝජනය කර තිබුණි.

2024 වර්ෂය වන විට මෙම සමාගම් 2 සඳහාම අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් දෙදෙනෙකු පමණක් සිට ඇත. වර්තමානය වන විට සමාගම් දෙකෙහිම සේවකයින් කිසිවෙකුත් නොමැත. එසේම ප්‍රාථමික ගනුදෙනු කිරීම සඳහා නැට් වෙල්ත් සෙකියුරිටීස් සමාගම වෙත ලබාදී තිබූ බලපත්‍රය 2020 දෙසැම්බර් 01 දින සිට අවලංගු වී ඇති බැවින් කොටස් වෙළඳපොලෙහි ආයෝජනය කිරීමට හැකියාවක් නොමැත.

අමාත්‍ය මණ්ඩලය විසින් 2021 මාර්තු 02 දිනැති අංක අමප/21/0269/313/012 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මත මෙම සමාගම් දෙක ඇවර කිරීමට තීරණය කර තිබේ. මෙම සමාගමට රුපියල් මිලියන 200 ක මුදලක් 2016 වර්ෂයේ දී ද ආයෝජනය කොට තිබුණි. ඒ අනුව රුපියල් බිලියන 22කට ආසන්න වටිනාකමක් මේ වන විට මෙම සමාගම් දෙකෙහි මහපොළ අරමුදල සතුව පවතී.

එසේම මෙම උපපාලිත සමාගම් හා එහි සේවකයින් අතර වූ අර්බුදයක් සම්බන්ධයෙන් වන නඩු කටයුත්තකට නඩු ගාස්තු ගෙවමින් මහපොළ භාරකාර අරමුදලේ අරමුදල් නාස්තිකාර ලෙස වියදම් කර තිබුණි.

2015 වර්ෂයේදී 19 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය බලාත්මක වීමත් සමග විගණකාධිපතිවරයාට රාජ්‍ය සමාගම් විගණනය කිරීම සඳහා බලය ලැබුණත් 2018 වර්ෂය තෙක් රජයේ විගණනය සඳහා අවස්ථාව ලබා දී නොතිබිණි.

තවද, 2022 වර්ෂයෙන් පසු මෙම සමාගම් දෙක සම්බන්ධ ගිණුම් වාර්තා කිසිවක් විගණනය සඳහා විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර නොතිබුණි. එසේම, අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මගින් මෙම සමාගම් දෙකෙහි ගිණුම් සකස් කිරීම සඳහා පෞද්ගලික ගිණුම්කරණ සමාගමකට භාර දී තිබුණි.

**ප්‍රාරම්භක භාරකරුගේ අදහස්:- (නිලබලයෙන් වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයේ අමාත්‍යවරයා)**

- මෙම සමාගම් ද්විත්වයම ඈවර කිරීමේ අවශ්‍යතාවයක් පවතින නමුත් එසේ කළ හොත් එම ආයතන දෙකෙහි අරමුදල් අවභාවිතා වී ඇති ආකාරය පිළිබඳව නිවැරදි තක්සේරුවක් ලබාගත නොහැකි වන බවත්, සමාගම් දෙකෙහිම අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා තවත් නිලධාරීන් දෙදෙනෙකු බඳවා ගැනීමට භාරකාර මණ්ඩලය විසින් තීරණය කොට ඇති බවත්.

එසේම මහපොළ භාරකාර අරමුදලේ අරමුදල්, අවදානම් සහගත මූල්‍ය ආයෝජනයන්ට යොදා තිබීම හේතුවෙන් වූ අලාභ සිදුවී තිබුණි. දක්ෂ අරමුදල් කළමනාකරුවන් ආයතනය තුළ නොමැති වීම එයට හේතු වී තිබුණි. එබැවින් වර්තමානයේදී ආරක්ෂිතම ක්‍රමවේදය වශයෙන් රජයේ පිළිගත් බැංකු ආයතන දෙකක් වන ලංකා බැංකුව හා මහජන බැංකුව සමග පමණක් මහපොළ භාරකාර අරමුදල සියලු ගනුදෙනු සිදු කරමින් සිටී.

සමස්ථ අරමුදලෙන් සුදුසු ආයෝජන සිදුකර, ආයෝජන අවස්ථා ඉහළ නංවමින් අරමුදල ශක්තිමත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් මහා භාණ්ඩාගාරයට වන වැය බර අඩු කිරීමට කටයුතු කිරීම සඳහා මෙවැනි අරමුදල් ගොඩ නංවා ඇති බව කාරක සභාව අවධාරණය කළාය.

එසේම මෙම අරමුදලේ සභාපති ධූරය විශ්‍රාමික ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරයෙක් විසින් දැරිය යුතු බවට නෛතික ප්‍රතිපාදන සලසා ඇත්තේ ස්වාධීනව, විනිවිදභාවයකින් යුතුව කටයුතු කිරීමට බව ද පෙන්වා දුන්නාය.

සද්භාවයෙන් පිහිටුවන ලද මෙම අරමුදල, අනාගතයේදී වඩා විනිවිදභාවයකින් යුතුව පරිපාලනය කිරීමට අවශ්‍ය තීන්දු තීරණ ගැනීමට සැලසුම් කරමින් සිටින බව කාරක සභාවට අනාවරණය විය.

<u>නිර්දේශය</u>

i. මේ සම්බන්ධයෙන් සම්පූර්ණ වෝහාරික විගණනයක් සිදුකර එහි නිර්දේශ මත අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට හෝ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට එම වාර්තාව ඉදිරිපත් කිරීම.

වෝහාරික විගණනය සිදු කිරීම දැනටමත් භාරකාර මණ්ඩලය විසින් තීරණය කර ඇති බවත් රාජකාරි බහුලත්වය හේතුවෙන් ජාතික විගණන කාර්යාලයට මෙම වෝහාරික විගණනය සිදු කළ නොහැකි බව ප්‍රකාශ කළ බැවින් පෞද්ගලික විගණන සමාගමක් හරහා මෙම වෝහාරික විගණනය සිදු කිරීම සඳහා මේ වන විට ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර ඇති බවත් කාරක සභාව හමුවේ අනාවරණය විය.

KPMG ආයතනය සම්බන්ධයෙන් නැවත සළකා බලන මෙන් කාරක සභාව ප්‍රකාශ කළාය.

ලංසු කැඳවීමේ දී KPMG ආයතනය අසාධු ලේඛනගත කර නොමැති බැවින්, ප්‍රසම්පාදන කමිටුව විසින් ගනු ලබන තීරණය අනුව කටයුතු කරන බවට කාරක සභාවට කරුණු අනාවරණය විය.

## 3.2 නිර්දේශ අංක 11- ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයේ අයිතිය

ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයෙහි (SLITT) අයිතිය ප්‍රකාශ කළ හැකි, අමාත්‍යාංශය සහ අරමුදල සතු නව තොරතුරු සහ ඒ පිළිබඳ අමාත්‍යාංශයේ නිරීක්ෂණ මසක් ඇතුළත පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ ලේකම් වෙත ඉදිරිපත් කරන ලෙස ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී ට නිර්දේශ කර තිබූ අතර ඒ පිළිබඳව කාරක සභාවේ අවධානය යොමු විය.

1981 අංක 66 දරන පනතේ 5 (ඇ) යටතේ වන පරමාර්ථය වන "යෞවනයන්ට තමන්ගේ වෘත්තීය නිපුණතා සහ දක්ෂතා වැඩිදියුණු කර ගැනීමට හැකිවන පරිදි වෘත්තීය අභ්‍යාස ආයතන පිහිටුවීම" යන පරමාර්ථය යටතේ භාර අරමුදලේ හා මහා භාණ්ඩාගාරයේ අරමුදල් යොදා ආරම්භ කරන ලද ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය (SLIIT) ඇපයෙන් සීමිත සමාගමක් ලෙස පිහිටුවා ඇත. පසුව මෙම සමාගම මහපොළ භාරකාර අරමුදලේ පාලනයෙන් ක්‍රමක්‍රමයෙන් බැහැරව පූර්ණ පෞද්ගලික ආයතනයක් ලෙස ක්‍රියාත්මක වන අතර 2015.05.12 වැනි දින ඇතිකරගත් ගිවිසුමක් ප්‍රකාරව මහපොළ භාරකාරීත්ව අරමුදල සමග ඇති බැඳියාවන් ඉවත් කර ඇති බව කාරක සභාව පෙන්වා දුන්නාය.

එසේ අරමුදලට ඇති අයිතිය ඉවත් කරගෙන ඇත්තේ SLITT ආයතනයේ රඳවා ගත් ලාභයෙන් රුපියල් මිලියන 408ක් මහපොළ අරමුදලට ලබා දීමෙන් අනතුරුවය.

මෙකී සියලු කටයුතු 2015 ජනවාරි මාසයෙන් පසු සිදුවී ඇති අතර 2015 දී පත්වූ රජය විසින් පත් කළ භාරකාර මණ්ඩලය විසින් මෙම තීරණය ගෙන ඇති අතර රු. මිලියන 408ක් වූ උක්ත චෙක්පත එවක අරමුදලේ සභාපතීත්වය දැරූ අගවිනිසුරුතුමාගේ නිල මැදිරියේදී භාරගෙන ඇති බවත් කාරක සභාව හමුවේ අනාවරණය විය. එසේම මෙම ගිවිසුමට සාක්ෂිකරුවන් ලෙස අත්සන් තබා ඇත්තේ ඇමතිවරු දෙදෙනෙකු බවත් (එවක අමාත්‍ය ධූර දරා ඇත්තේ ගාමිණී ජයවික්‍රම පෙරේරා හා සරත් අමුණුගම යන අයයි) වර්තමානය වන විට මහපොළ භාරකාරීත්ව අරමුදලට අයිතිව තිබෙන්නේ SLIIT ආයතනය පිහිටි ඉඩම පමණක් බවත් තවදුරටත් අනාවරණය විය.

නමුත් දේපළ සම්බන්ධයෙන් මහපොළ අරමුදලට අයිතියක් නොමැති බවටත්, හා එම දේපළ වලට ඇතුළුවිය හැක්කේ SLIIT ආයතනයේ අවසරය මත වන බවට නීතිපති දෙපාර්තමේන්තුවෙන් උපදෙස් ලබා දී ඇති බව මහපොළ භාරකාර අරමුදලේ සභාපතිවරයා අනාවරණය කළේය.

තවද, 2017.05.08 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයේ ද මෙම ආයතනය පෞද්ගලික අංශය සතු කිරීම සඳහා වන වංචා සහගත කරුණු සඳහන් කර ඇති බව කාරක සභාවට අනාවරණය විය.

නැට් වෙල්ත් සෙකියුරිටීස් ලිමිටඩ් ආයතනයේ අධ්‍යක්ෂවරයා සඳහන් කළේ;

රාජ්‍ය ආයතනයක් ලෙස සද්භාවයෙන් පිහිට වූ මෙම ආයතනය අධික තණ්හාව හේතුවෙන් මෙසේ රාජ්‍ය නිලධාරීන්ගේ පාලනයෙන් බැහැර කරගෙන තිබෙන බව හා වර්තමානය වන විට තමා ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් තිදෙනාම අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ඉවත් කර ඇති බවයි.

2019 න් පසුව ගෙවුණු කාලය තුළ හා 2025 ජනවාරි මස සිට මේ දක්වා මෙම කටයුතු සම්බන්ධයෙන් නව භාරකාර මණ්ඩලය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව කාරක සභාව විමසීය.

විජයදාස රාජපක්ෂ, බන්ධුල ගුණවර්ධන හා නැවත විජයදාස රාජපක්ෂ හා නලින් ප්‍රනාන්දු යන අමාත්‍යවරු විසින් අවස්ථා 3 ක දී මේ සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල සංදේශ යොමු කර ඇති බව හා 2022 වර්ෂයේ දී මෙම ආයතනය නැවත 2015 වර්ෂයට පෙර තිබූ තත්ත්වයට පත්කරන ලෙසට අමාත්‍ය මණ්ඩල තීරණයක් ලබා ගත්තද එහිදී නීතිපතිවරයාගේ මතය විමසන ලෙසට කොන්දේසියක් ද සඳහන් ව තිබූ බවත්, 2023 වර්ෂයේ දී ලබා ගත් අමාත්‍ය මණ්ඩල තීරණය අනුව 2022 වර්ෂයේ ගත් අමාත්‍ය මණ්ඩල තීරණය අවලංගු කර ඇති බවත්, 2023 වර්ෂයේ දී ලබා ගත් අමාත්‍ය මණ්ඩල තීරණය මත පදනම්ව කටයුතු කිරීමට වත්මන් භාරකාර මණ්ඩලයට සිදුවී ඇති බවත්, 2022 වර්ෂයේ දී උපාලි අබේරත්න කමිටුව හමුවේ ශ්‍රී පවන් මහතාගේ

කරුණු දැක්වීම මගින් සත්‍ය සිදුවීම අනාවරණය වූ බවත් කාරක සභාව නිරීක්ෂණය කළාය.

<u>නිර්දේශ</u>

i. මෙම ආයතනය පෞද්ගලික අංශය සතු කිරීමේ වැඩපිළිවෙළ තුළ බරපතල වංචාවක් සිදුවී ඇති බැවින් පූර්ණ බලය සහිත කොමිසමක් පත්කොට මේ සම්බන්ධයෙන් විමර්ශනයක් සිදු කිරීමත්, ඒ මගින් අනාවරණය වන තොරතුරු මත පදනම්ව සිදුකර ඇති වංචාවට සම්බන්ධයෙන් දඬුවම් ලබාදීමටත් කටයුතු කිරීම.

ii. ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය (SLITT) මහපොළ භාරකාර අරමුදලේ පරිපාලිත ආයතනයක් බවට නැවත පත් කිරීමට අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගැනීම.

iii. මෙම ආයතනය නැවත අරමුදලට පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකිරීම සඳහා ලබා දී ඇති නිර්දේශ පිළිබඳ නැවත සළකා බැලීම අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා කටයුතු කරන මෙන් නීතිපති දෙපාර්තමේන්තුවට ඉල්ලීමක් යොමු කිරීම.

iv. මෙම ආයතනය පවරාදීම සම්බන්ධයෙන් වන තීරණය, නැවත සමාලෝචනය කිරීම අවශ්‍ය නම් අමාත්‍ය මණ්ඩල තීරණයක් මගින් එය සිදු කිරීම සම්බන්ධව ගරු අමාත්‍යතුමාගේ අවධානයට යොමු කිරීම හා ඒ පිළිබඳ වගකීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් දැරීම.

**මෙම සාකච්ඡාවේ අරමුණ වන්නේ SLITT ආයතනයේ අයිතිය නැවත මහපොළ භාරකාර මණ්ඩලය යටතට ගැනීම පමණක් බවත් එහි අධ්‍යයන කටයුතුවලට හෝ පාඨමාලාවන්ට බාධා පැමිණවීමට අදහස් නොකරන බවත් හා මහපොළ අරමුදලේ අරමුණුවලට මෙය යටත් කිරීමට අපේක්ෂා කිරීම මගින් රටේ දරුවන්ට සාධාරණත්වයක් ඉටු කිරීමට බලාපොරොත්තුවන බව කාරක සභාව තරයේ අවධාරණය කළ අතර එය ප්‍රාරම්භක භාරකරු ද සනාථ කළේය.**

සිදුවී ඇති වරද අමාත්‍ය මණ්ඩල තීරණයක් මගින් නිවැරදි කර ගැනීමට වත්මන් ආණ්ඩුව වශයෙන් කටයුතු කිරීමට බලාපොරොත්තු වන බව ප්‍රාරම්භක භාරකරු ප්‍රකාශ කළේය.

මෙහිදී, විගණන ක්‍රියාවලිය ශක්තිමත් කිරීමේ හා කාර්යසාධන විගණනයක ඇති (performance Audit) අවශ්‍යතාවය කාරක සභාව පෙන්වා දුන්නාය.

## 3.3 <u>මංගත ලොතරැයිය නැවත ක්‍රියාත්මක කිරීම -2021</u> - <u>නිර්දේශ අංක 09</u>

මංගත ලොතරැයිය සඳහා තෝරාගත් ලොතරැයිකරු එයින් ඉවත්වීම හේතුවෙන් ලොතරැයියේ ක්‍රියාකාරීත්වය ඇණහිටී තිබුණි.

2021 ඔක්තෝබර් 18 වැනි දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ අනුමැතිය යටතේ මංගත ලොතරැයිය නැවත දියත් කිරීමට අදාළ ප්‍රසම්පාදන කටයුතු 2022 වර්ෂයේ ආරම්භ කර තිබුණි. තවද, ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුකූලව සුදුසු ආයෝජකයෙක් තෝරා, ඒ සඳහා භාරකාර මණ්ඩලයේ අනුමැතිය ද ලබා ගෙන තිබූ අතර, ගිවිසුමේ කෙටුම්පත සඳහා එම ලංසුකරු එකඟ වී තිබුණි. තවද නීතිපතිවරයාගේ අනුමැතිය ද ඒ සඳහා ලැබී තිබුණි.

නමුත් මෙසේ තෝරාගත් ආයෝජකයා 10%-15% ක් දක්වා ද ස්ථාවර රාජ්‍ය භාගය රුපියල් මිලියන 100- 200 දක්වා සංශෝධනය කිරීමට එකඟ වී ඇති නමුත්, තවත් ආයෝජකයෙකුගෙන් අඩු ලංසුවක් ලැබී ඇති බැවින් පළමුවෙන් තෝරාගත් ආයෝජකයා තෝරාගැනීම අහෝසි කරන බව දන්වා ඇති බවත් කාරක සභාව නිරීක්ෂණය කළාය.

මෙම නව ආයෝජකයා තෝරා ගැනීමට තාක්ෂණික කමිටුවේ නිර්දේශය හා අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශය ලැබී ඇති බවත්, මිල ගණන් සාකච්ඡා කර

අවසන් තීරණය ගැනීමට භාරකාර මණ්ඩලය වෙත දැනුම්දී ඇති බවත් තවදුරටත් අනාවරණය විය.

තාක්ෂණික කමිටුවේ නිර්දේශය අනුව, Substantially responsive highest bidder වෙත මෙම ප්‍රසම්පාදනය පිළිගන්වන මෙන් තීරණය කරන ලද බවත්, අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවෙන් Genlot Game Technologies සමාගමට අනුමැතිය දී තිබූ බවත්, මිල ගණන් සාකච්ඡා කර මේ සම්බන්ධයෙන් අවසන් තීරණය ගැනීමට භාරකාර මණ්ඩලය වෙත දැනුම් දී ඇති බවත්, කාරක සභාවේදී අනාවරණය විය.

<u>නිර්දේශ</u>

- **i.** මේ සම්බන්ධයෙන් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමේ විමර්ශන කටයුතු කඩිනම් කිරීමට අවශ්‍ය පියවර ගැනීම.
- **ii.** ඒ සඳහා අතිරේක තොරතුරු අවශ්‍යවේ නම් ඒවා ලබා දීමට අවශ්‍ය කටයුතු කිරීම.

## 04. <u>2022 හා 2023 වර්ෂවල විගණන වාර්තාවලින් අනාවරණය වන කරුණු හා වර්තමාන තත්ත්වය</u>

### 4.1 <u>මහපොළ ශිෂ්‍යත්වය ලැබීමට සුදුසු සිසුන් තෝරා ගැනීම හා මහපොළ ශිෂ්‍යත්ව ගෙවීම් කාලයේ වන ප්‍රමාදයන් අවම කිරීම</u>

විශ්වවිද්‍යාලවලට බඳවා ගන්නා හා ශිෂ්‍යත්වයක් ලැබීමට සුදුසුකම් ඇති සියළුම සිසුන් සඳහා මහපොළ ශිෂ්‍යත්වයක් පිරිනැමීම ඉලක්ක කර තිබුණ ද, දෙමාපියන් විසින් උපයනු ලබන වාර්ෂික ආදායම රු.500,000 ට අඩු විය යුතුය යන නිර්ණායකය පදනම් කර ගැනීම හේතුවෙන් 2020/2021 හා 2021/2022 අධ්‍යයන වර්ෂයට අදාළව මහපොළ ශිෂ්‍යත්ව ලැබීමට සුදුසුකම් ලද සිසුන් පිළිවෙලින් 20,000 හා 26,000 ක් අතරින් සිසුන් 15,000 හා 16,000 කට එනම්, 75 % හා 61.5% ක් වන සිසුන්ට පමණක් ශිෂ්‍යත්ව පිරිනමා තිබුණි.

මහපොළ ශිෂ්‍යත්ව ලැබීමට සුදුසු ශිෂ්‍යයන් තෝරාගැනීම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් සිදු කරනු ලබයි.

අරමුදල සතු මුදල් සංචිත මත පදනම්ව ලබා දෙන ශිෂ්‍යත්ව සංඛ්‍යාව තීරණය කොට, ශිෂ්‍යත්ව ලබා දිය හැකි උපරිම ශිෂ්‍ය සංඛ්‍යාවට ශිෂ්‍යත්ව ලබා දෙන බවත්, විශ්වවිද්‍යාල ශිෂ්‍යන්ට අමතරව තවත් උසස් අධ්‍යාපන ආයතන හා කාර්මික විද්‍යාලවල සිසුන්ට ද ශිෂ්‍යත්ව ලබා දෙන බව හා මසකට සිසුන් 70,000-80,000 කට පමණ ශිෂ්‍යත්ව ලබාදෙන බවත් කාරක සභාවට අනාවරණය විය.

විශ්වවිද්‍යාල සිසුන් සඳහා ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමේදී යාවත්කාලීන දත්ත පද්ධතියක් පැවතීමේ වැදගත්කම මෙහිදී අවධාරණය කෙරිණි.

**<u>නිර්දේශ</u>**

i. ශිෂ්‍ය සංඛ්‍යාව විචලනය වීම, ගෙවීම් කාලයේ වන ප්‍රමාදයන් පිළිබඳව අවධානය යොමු කර මහපොළ ගෙවීම් යාන්ත්‍රණය වේගවත් කිරීමට කටයුතු කිරීම හා ශිෂ්‍යත්ව ලැබීමට සුදුසුකම් ලැබූ සියලුම සිසුන්ට ශිෂ්‍යත්ව ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.

ii. රජයෙන් ගෙවිය යුතු මුදල් කඩිනමින් ලබා ගැනීමට අවශ්‍ය පියවර ගැනීම.

### 4.3 <u>මහපොළ වෙළෙඳ ප්‍රදර්ශනය</u>

අරමුදල් සපයා ගැනීමේ අරමුණින් 2023 දෙසැම්බර් 13 සිට 17 දක්වා ජාඇල නගර සභා ක්‍රීඩාංගනයේ මහපොළ වෙළඳ ප්‍රදර්ශනයක් පවත්වා තිබූ අතර ඒ සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද ආදායම් ප්‍රකාශනය අනුව වෙළඳ ප්‍රදර්ශනය මගින් රු.2,9046,884ක අලාභයක් සිදුවී තිබුණි.

මේ පිළිබඳව කරුණු දැනගන්නා ලද්දේ විගණන විමසුම මගින් වන බවත්, භාරකාර මණ්ඩල තීරණ අනුව වෙළඳ ප්‍රදර්ශන ලේකම් කාර්යාලයට මුදල් භාර දී ඇති බව

ලේඛනවල සඳහන් වන බවත්, භාරකාර මණ්ඩල තීරණයක් මත වෙළඳ ප්‍රදර්ශන ලේකම් කාර්යාලයක් පිහිටුවා ඇති බවත් කාරක සභාවට අනාවරණය විය.

එමෙන්ම එම වෙළෙඳ ප්‍රදර්ශන ලේකම් කාර්යාලයේ ගිණුමට ප්‍රවේශ වීමට, භාරකාර මණ්ඩලයට හැකියාවක් නොමැති බවත්, භාරකාර මණ්ඩලයේ අවසරය සහිතව මේ පිළිබඳව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇති බවද අනාවරණය විය.

රාජ්‍ය දේපළ අවභාවිතා කිරීමේ උවමනාවක් සහිතව මෙම කටයුත්ත සිදුවී තිබේදැයි පරීක්ෂා කළ යුතු බව කාරක සභාව අවධාරණය කළ අතර මෙම ප්‍රදර්ශනය අධ්‍යාපන හා වෙළඳ ප්‍රදර්ශනයක් ලෙස ක්‍රියාත්මක වූ බවත් එහි දී වගකිම් එක් එක් කමිටු අතර පවරා දුන් ආකාරය පිළිබඳවත් මෙහිදී කරුණු අනාවරණය විය.

<u>නිර්දේශය</u>

i. වෝහාරික විගණනය සිදුකිරීමේදී මෙම කරුණ ද ඇතුළත් කර මේ සම්බන්ධයෙන් ගන්නා ලද ක්‍රියාමාර්ග පිළිබඳව තොරතුරු ඉදිරිපත් කිරීම.

## 4.4 <u>2023 වර්ෂය තුළ කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් බඳවා ගැනීම</u>

2023 වර්ෂය තුළ කොන්ත්‍රාත් පදනම මත වසර 02ක කාලයක් සඳහා වෙළඳ ප්‍රදර්ශන සම්බන්ධීකරණ නිලධාරීන් 05 දෙනෙකු සහ කළමනාකරණ සහකාරවරු 03 දෙනෙක් සඳහා පත්වීම් ලබා දී තිබූ අතර ඔවුන්ගේ පත්වීම්වල නීත්‍යානුකූලභාවය, බඳවාගැනීමේ ක්‍රියාවලිය, ඔවුන්ගේ දීමනා තීරණය කිරීමේ පදනම, රාජකාරී පැවැරුම් කිරීම, රාජකාරී සඳහා වාර්තා කරන ස්ථාන, ආසන්නතම අධීක්ෂණ නිලධාරියා හා රාජකාරී ඉටුකිරීම සම්බන්ධයෙන් පිළිගත හැකි ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවූ අතර එම නිලධාරීන්ට 2023 ජූලි සිට 2024 පෙබරවාරි දක්වා කාලය සඳහා රු.1,920,833ක් වැටුප් හා දීමනා ලෙස අරමුදල විසින් ගෙවා තිබුණි.

කාර්ය මණ්ඩලය පවරා ගැනීමේ ලිපි භාරකාර අරමුදල විසින් නිකුත් කර නොමැති බව මෙහිදී අනාවරණය විය.

<u>**නිර්දේශය**</u>

i. වෝහාරික විගණනය සිදුකිරීමේදී මෙම කරුණ ද ඇතුළත් කිරීම.

## 4.5 <u>මිල්ලෑව වත්ත ඉඩම</u>

යෝජිත ජාත්‍යන්තර විශ්වවිද්‍යාල ගම්මානය ඉදිකිරීම සඳහා මිලට ගත් හොරණ මිල්ලෑව වත්ත ඉඩම සඳහා මහපොළ භාරකාර අරමුදල විසින් රුපියල් මිලියන 200 ක පමණ මුදලක් ගෙවා තිබුණි. නාගරික සංවර්ධන අධිකාරිය විසින් තවත් රුපියල් බිලියන 2ක මුදලක් ගෙවන ලෙස අරමුදලට දැනුම් දී තිබුණද ඒ සඳහා අරමුදලට මූල්‍ය ශක්‍යතාවයක් නොමැති බවත් එම ආයෝජනය අරමුදලට අහිතකර ආයෝජනයක් වන බැවින් එම මුදල නැවත ලබා ගෙන ඉඩම නාගරික සංවර්ධන අධිකාරිය වෙත පවරා දීමට නාගරික සංවර්ධන අධිකාරිය සමග සාකච්ඡා කොට ඇති බවත් කාරක සභාවට අනාවරණය විය.

මෙම ඉඩමේ අයිතිය පාදුක්ක ප්‍රාදේශීය ලේකම්ට ඇති බවත්, නාගරික සංවර්ධන අධිකාරියට මේ ඉඩම සම්බන්ධ අයිතියක් නොමැති බවත්, එලෙස අයිතිය නිරවුල් නොවූ ඉඩමකට මහපොළ භාරකාර අරමුදල විසින් මුදල් ගෙවා ඇති බවත් කාරක සභාවට අනාවරණය විය.

<u>**නිර්දේශය**</u>

i. වෝහාරික විගණනය සඳහා මෙම කරුණ ද ඇතුළත් කිරීම.